# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2483/02 - 2026 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා - 2026.04.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත**

2 වන වගන්තිය යටතේ වන නියමය

1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි උපලේඛනයේ නිශ්චිත සීමා තුළ පිහිටි ඉඩම සහ ගොඩනැඟිලි වර්ෂ 2025 ඔක්තෝබර් මස 30 වැනි දින සිට බලාත්මක වන පරිදි උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලයේ පාලනය යටතේ පැවතිය යුතු යැයි උපරිමාධිකරණ සංකීර්ණ කළමණාකාර මණ්ඩලය මෙයින් ප්‍රකාශ කර සිටියි.

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩලයේ අණ පරිදි,

උපරිමාධිකරණ සංකීර්ණයේ මාර්ෂල්.

2026 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී වසමේ, කොළඹ මහ නගර සීමාව තුළ පිහිටියා වූ ද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2018.12.27 දිනැති මූලික පිඹුරු අංක 9796 හි ලොට් අංක 01 වශයෙන් දැක්වෙන වරිපනම් අංක 129 දරන විජේරාම මාවත පිහිටි මුළු භූමි භාගය පහත සඳහන් පරිදි වේ:-

*උතුරට* : විජේරාම මාවතේ වරිපනම් අංක 127 දරන දිසාපති නිල නිවස පිහිටි ඉඩම සහ කො. 7784 දරන මූලික පිඹුරේ කැබලි අංක 1;

*නැගෙනහිරට* : කො.7784 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 සහ බෞද්ධාලෝක මාවත

*දකුණට* : බෞද්ධාලෝක මාවත සහ විජේරාම මාවත; සහ

*බස්නාහිරට* : විජේරාම මාවත සහ විජේරාම මාවතේ වරිපනම් අංක 127 දරන දිසාපති නිල නිවස පිහිටි ඉඩම,

යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.4999 ක විශාලත්වය දරන ඉඩම සහ ඒ තුළ පිහිටි අගවිනිසුරු නිලනිවස ඇතුළු සියලු දේ ද වේ.

EOG 04 - 0041